ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. දැන් Adjournment Motion එක. Hon. Nalin Bandara Jayamaha, you can move the Adjournment Motion now. - [*Interruption*.]

එයාර්බස් ගනුදෙනුව
எயார்பஸ் கொடுக்கல்வாங்கல்
AIRBUS DEAL

[අ.භා. 12.13]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"එක්සත් රාජධානියේ අධිකරණයක් විසින් 2020 ජනවාරි මස 31 වෙනි දින ලබා දුන් නඩු තීන්දුවක් මඟින් පසුගිය රාජපක්ෂ පාලන සමයේ සිදු වූ සුප්‍රසිද්ධ වංචා සහගත ගනුදෙනුවක් වන ශ්‍රීලන්කන් ගුවන් සමාගම සඳහා ප්‍රංශයේ එයාර්බස් සමාගමෙන් ගුවන් යානා 10ක් මිලදී ගැනීමේ සිද්ධිය නැවත කරළියට පැමිණ තිබේ.

A330 වර්ගයේ ගුවන් යානා හයක් හා A350 වර්ගයේ ගුවන් යානා හතරක් ශ්‍රීලන්කන් ගුවන් සමාගමට මිලදී ගැනීමත්, තවත් A350 ගුවන් යානා හතරක් බද්දට ගැනීමටත් මෙම ගිවිසුම් ඇති කරගෙන ඇති අතර, ශ්‍රීලන්කන් ගුවන් සමාගම මිලදී ගන්නා සෑම A330 ගුවන් යානයක් සඳහා ඩොලර් මිලියනයක්ද, බදු ගන්නා සෑම A350 ගුවන් යානයකටම මිලියන 1.16ක්ද වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 16.84ක කොමිස් මුදලක්ද ගෙවීමට එකඟ වී ගිවිසුමක් අත්සන් කර ඇති බවත්, එම කොමිස් මුදලෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 02ක මුදලක් 2011 වසරේ සිට 2015 ජනවාරි මාසය දක්වා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරන ලද කපිල චන්ද්‍රසේන නමැත්තාගේ භාර්යාවගේ බැංකු ගිණුමකට බැර වී ඇති බවත්, එමඟින් අනාවරණය වී ඇත. මෙම ගනුදෙනුවේදී සිදුව ඇති අක්‍රමිකතාවලට අමතරව, මෙම දූෂිත ගනුදෙනුව අවලංගු කිරීම හේතුවෙන් රුපියල් බිලියන 17ක් ගෙවීමට ද රජයට සිදුව ඇත.

මෙම තත්ත්වය යටතේ, මෙම සාපරාධී ගනුදෙනුවට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නේද යන්නත් මෙම පාඩුව රජයට අය කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද යන්නත් රජයෙන් විමසා සිටින අතර, මෙම ගනුදෙනුව සම්බන්ධව අනාවරණය වී ඇති කරුණු සියල්ල පිළිබඳව රජය විසින් මෙම ගරු සභාවත්, රටේ මහජනතාවත් වහාම දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවයෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මේ රාජපක්ෂ පාලනය ආරම්භ කරලා මාස තුනයි. මීට කලින් 2010ත් 2015ත් අතර රාජපක්ෂ පාලනය තිබුණු කාලයේ අපි දිගින් දිගටම කථා කළා, මේ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගම සම්බන්ධව. අපි දිගින් දිගටම කථා කළා! හැබැයි, අද මේ රජය බලයට පත් වුණු ගමන්ම ඩොලර් මිලියන 16.84ක කොමිස් මුදලක් ඉල්ලා ඒකෙන් ඩොලර් මිලියන දෙකක්, -රුපියල් කෝටි 38කට ආසන්න මුදල් ප්‍රමාණයක්- එවකට ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් හිටපු කපිල චන්ද්‍රසේනගේ නෝනාගේ ගිණුමට බැර කරලා තිබෙනවා. කවුද, මේ කපිල චන්ද්‍රසේන කියන්නේ? ඔහු තමයි මේ ගොල්ලන් මංකොල්ල කාලා අරගත්තු ආණ්ඩුව තුළ, රාජපක්ෂ මහත්තයාගේ දවස් 52 ආණ්ඩුව තුළ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ සභාපති ධුරයට තෝරා ගත්තු නිලධාරියා. ඔහු 2010 සිට 2015 වනතුරු ඒ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි; දවස් 52 ආණ්ඩුව තුළ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා.

ඒ විතරක් නොවෙයි. 2010 සිට 2015 වනතුරු ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා හැටියට හිටියේ කවුද? නිශාන්ත වික්‍රමසිංහ මහත්මයායි. මේ ඩොලර් මිලියන දෙකක කොමිස් මුදල ප්‍රධාන විධායක නිලධාරියාගේ ගිණුමට වැටෙන කොට ඒ සමාගමේ ප්‍රධාන සභාපතිවරයා එතුමායි. ඒ සභාපතිවරයා කවුද? ඒ, වෙන කවුරුත් නොවෙයි, මහින්ද රාජපක්ෂ වර්තමාන අගමැතිතුමාගේ ආර්යාවගේ වැඩිමහල් සහෝදරයායි. එහෙම නම් නිශාන්ත වික්‍රමසිංහ මහත්මයා නොදැන ඒ කොමිස් මුදල ගන්න පුළුවන්ද? එතකොට ඒ ඩොලර් මිලියන 16.84න් ඉතුරු මුදල් කාටද ගියේ? ඩොලර් මිලියන 16.84න් ඩොලර් මිලියන දෙකක් තමයි ප්‍රධාන විධායක නිලධාරියාට ගියේ. ගරු කථානායකතුමනි, රුපියල් බිලියන 2.5කට ආසන්න ප්‍රමාණයක්. ප්‍රධාන විධායක නිලධාරියාට ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකක් ආවා නම්, ඇමෙරිකානු ඩොලර් මිලියන 16.84හි ඉතිරි මුදල කොහේටද ගියේ? ඒ වෙලාවේ හිටපු සභාපතිවරයා නිශාන්ත වික්‍රමසිංහ මහත්මයායි; මස්සිනායි. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එක "මස්සිනාකරණය" කළා කියලා අපි කිව්වා. ඒ වෙලාවේ මේ ආයතනය භාරව හිටපු ඇමතිවරයා මහින්ද රාජපක්ෂ මහත්මයා; රටේ ජනාධිපතිවරයා. එහෙම නම්, මේ ගරු සභාවෙන් අපි අහනවා, මහින්ද රාජපක්ෂ මහත්මයා නොදැනද, නිශාන්ත වික්‍රමසිංහ මහත්මයා නොදැනද, මේ කපිල චන්ද්‍රසේන ඇමෙරිකානු ඩොලර් මිලියන දෙක - රුපියල් කෝටි තිස්අට - ගත්තේ කියලා. මේක වෙන්න බැහැ, ගරු කථානායකතුමනි. මේක වෙන්න බැහැ. අපි දන්නවා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට අත්වුණු ඉරණම මොකක්ද කියලා.

1947 වසරේ "එයාර් සිලෝන්" විධියට පටන් ගත්ත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම 1978 වසරේ රජයට පවරා ගත්තා. එම සමාගම 1998 වසරේ සියයට 40ක කොටස් එමිරේට්ස් සමාගමට දෙනවා. එමිරේට්ස් සමාගමට දුන්නු දවස දක්වා ලොකු ලාභයක් "ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම" එහෙම නැත්නම් එවකට "ශ්‍රීලංකන් ගුවන් සමාගම" ලැබුවේ නැහැ.

හැබැයි, ගරු කථානායකතුමනි, මේ සමාගම එමිරේට්ස් ආයතනයට ලබා ගත් පසුව 1998/1999 වසරේදී රුපියල් මිලියන 1,273ක් ලාභ ලබනවා; 1999/2000 වසරේදී රුපියල් මිලියන 3,661ක් ලාභ ලබනවා; 2000/2001 වසරේදී රුපියල් මිලියන 2,049ක් ලාභ ලබනවා; 2002/2003 වසරේදී රුපියල් මිලියන 3,347ක් ලාභ ලබනවා; 2003/2004 වසරේදී රුපියල් මිලියන 7,424ක් ලාභ ලබනවා; 2004/2005 වසරේදී රුපියල් මිලියන 460ක් ලාභ ලබනවා; 2005/2006 වසරේදී රුපියල් මිලියන 476ක් ලාභ ලබනවා; 2006/2007 වසරේදී රුපියල් මිලියන 568ක් ලාභ ලබනවා. 2007/2008 වසරේදී රුපියල් මිලියන 4,428ක් ලාභ ලබමින් තිබුණු ශ්‍රීලංකන් එයාර් ලයින්ස් සමාගම, ඒ අවුරුදු 10ක ගිවිසුම අවලංගු කරලා ඒ වෙනුවෙන් ඒ සමාගමට වන්දි ගෙවලා තමයි රාජපක්ෂ රජයට පවරා ගන්නේ. ඒ සඳහා මුදල් යොදවන්නේ කවුද? ඒ, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සේවක අර්ථ සාධක අරමුදලයි. ඒ, සේවක අර්ථ සාධක අරමුදලට හානි කරපු තවත් අවස්ථාවක් තමයි. කෝටි ගණනකින් සේවක අර්ථ සාධක අරමුදලට හානි කරලා තිබුණා, හොරකම් කරලා තිබුණා කියලා වෝහාරික විගණන වාර්තාව තුළින් අපි, ඊයේ පෙරේදා දැක්කා. මෙන්න, සේවක අර්ථ සාධක අරමුදල අවභාවිත කරපු තවත් අවස්ථාවක්. මෙහෙම රජයට පවරා ගත්ත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම ඉන් පසුව මස්සිනාට භාර දෙනවා. රාජපක්ෂ පාලනය, පවුල් පාලනය විසින් "මස්සිනාකරණයට" භාර දෙනවා. මස්සිනාකරණයට භාර දුන්නාට පසුව මොකද වෙන්නේ, ගරු කථානායකතුමනි? එතෙක් ලාභ ලබපු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම ඉන් පසුව පාඩු ලබන්න පටන් ගන්නවා. 2008/2009 වසරේ රුපියල් මිලියන 9,306ක් පාඩු ලබනවා ගරු කථානායකතුමනි. 2009/2010 වසරේ රුපියල් මිලියන 2,698ක් ලාභ ලබනවා. 2010/2011 වසරේ රුපියල් මිලියන 382ක් අලාභ ලබනවා. 2011/2012 වසරේ රුපියල් මිලියන 19,778ක් අලාභ ලබනවා; පාඩු ලබනවා. 2012 /2013 වසරේ රුපියල් මිලියන 26,089ක් පාඩු ලබනවා. 2013 වසරේ විතරක් රුපියල් බිලියන 26ක් පාඩු ලබනවා. රුපියල්

බිලියන 26ක් කියන්නේ ගරු මන්ත්‍රීවරුනි නෙළුම් කුලුනු දෙකක් හදන සල්ලි. නෙළුම් කුලුනු දෙකක් හදන සල්ලි එක අවුරුද්දකට අලාභ ලබනවා. 2013/2014 වසරේ රුපියල් මිලියන 32,408ක් අලාභ ලබනවා. 2014/2015 වසරේ රුපියල් බිලියන 16ක් අලාභ ලබනවා. ඒ සියල්ලේ එකතුව රුපියල් බිලියන 461ක්. මස්සිනාකරණය හරහා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එක ලැබූ අලාභය රුපියල් බිලියන 461ක්! මේක එසේ මෙසේ මුදලක් නොවෙයි ගරු කථානායකතුමනි.

දැන් ආණ්ඩුව අතුරු සම්මත ගිණුම් -Votes on Account - ගේනවා සල්ලි සොයන්නට. රාජපක්ෂවරු ශ්‍රීලන්කන් එයාලර්යින්ස් එකේ රුපියල් බිලියන 461ක් පාඩු කරලා තිබෙනවා, 2008 සිට 2015 වනතෙක්. 2008 ඉඳන් 2015 වෙනකම් රුපියල් බිලියන 461ක් පාඩු කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීවරුනි, මේක පොඩි ගණුනක් නොවෙයි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හදන්නට ගියේ රුපියල් බිලියන 50යි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජාතික ධනය.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය වාගේ මාර්ග 9ක් හදන්න පුළුවන් මුදල් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකෙන් හොරකම් කරලා තිබෙනවා; අලාභ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, නොරොච්චෝලේ බලාගාරය හදන්නට ගියේ රුපියල් බිලියන 150යි. නොරොච්චෝලේ බලාගාරය වාගේ 3ක් හදන මුදල්, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය වාගේ 9ක් හදන්න පුළුවන් මුදල්, නෙළුම් කුලුන වාගේ 16ක් හදන්න පුළුවන් මුදල් මස්සිනාකරණය නිසා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමට අහිමිවෙලා තිබෙනවා. කපිල චන්ද්‍රසේන මහත්මයලා දාගෙන එදා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකට අලාභ කළා විතරක් නොවෙයි, මහා ගනුදෙනුවක් කරලා තිබෙනවා, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකට කුලී පදනම මත airbuses ගෙන එමේ ගිවිසුම හරහා. අපි පැහැදිලිවම මේ රටේ ජනතාවට මේ කාරණය කියනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ඡන්දය ලබා දුන් ලක්ෂ 69ක් වන ජනතාවගෙන් ලක්ෂ 40ක් විතර "බයියෝ" ඉන්නවා, ඒ බයියන්ට නොවෙයි මේ කියන්නේ. මේ කියන්නේ බයියන්ට නොවෙයි ගරු කථානායකතුමනි. මේ ලක්ෂ 40ට එහා ගිය, ලක්ෂ 29ක් ඉන්නවා, මේ රටේ බුද්ධිමත් මිනිස්සු, මධ්‍යස්ථ මිනිස්සු. ඒ මධ්‍යස්ථ ජනතාවටයි අපි මේවා කියන්නේ. කපිල චන්ද්‍රසේන මහත්මයා ඇමෙරිකානු ඩොලර් මිලියන 2ක් හොරකම් කළා නම්, මේ කොමිස් ගනුදෙනුව ඩොලර් මිලියන 16.84යි නම්, ඉතිරි ඩොලර් මිලියන 14.84 කොහේටද ගියේ? ඩොලර් මිලියන 2ක් කපිල චන්ද්‍රසේනගේ නෝනාගේ ගිණුමට බැර වෙලා තිබෙනවා කියලා පැහැදිලිවම ඔප්පු වෙලා තිබෙනවා. ඒ පිළිබඳ වහාම සොයන්න ඕනෑ. ඒ මුදල පොඩි මුදලක් නොවෙයි. ඩොලර් මිලියන 16.84ක් කියන්නේ පොඩි මුදලක් නොවෙයි. පෙර හොරකම් කරපු ඒවා වෝහාරික විගණන වාර්තාවෙන් හෙළි වෙලා තිබෙනවා. මෙතැන ඊටත් වඩා විශාල මුදලක් හොරකම් කරලා තිබෙනවා ගරු කථානායකතුමනි. අපි පැහැදිලිව කියන්න කැමැතියි, රාජපක්ෂ පාලනය තුළ කපිල චන්ද්‍රසේන මහත්මයාට විශාල ගෞරවයක් තිබුණු බව. ඒ නිසා තමයි, 2019 වර්ෂයේ "දවස් 52 ආණ්ඩුවෙන්" ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා වශයෙන් පත් කරලා ඔහුට promotion එකක් දුන්නේ. 2015 වර්ෂයට කලින් කොමිස් ගත්ත හාදයාට promotion එකක් දෙන්නේ නිකම් නොවෙයි. මෙය එකතු වෙලා ගහපු ගේමක්. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ගුවන් යානා 8ක් මිලදී ගන්න කොට, ඒ ගනුදෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරියාට තනියම ගහන්න බැහැ. ඉහළින් සිටින සභාපතිවරයාට මෙය පෙනෙන්නේ නැද්ද? මෙය, ත්‍රී වීලර් 8ක්, බස් 8ක් හෝ කෝච්චි 8ක් මිලදී ගත් සිද්ධියක් නොවෙයි, ගුවන් යානා මිලදී ගත් සිද්ධියක්. කපිල චන්ද්‍රසේන මහත්මයාට ඉහළින් සිටියේ රාජපක්ෂ මහත්මයාගේ මස්සිනා, නිශාන්ත වික්‍රමසිංහ මහත්මයා; මස්සිනාකරණය කරපු සභාපතිවරයා සිටියේ. එහෙම නම්, ඔහු මෙයට සම්බන්ධයි. ඔහුටත් මෙය තනියම කරන්න බැහැ. අදාළ ආයතනය අයත් අමාත්‍යාංශයේ ඇමතිවරයා ඉන්නවා, රටේ නායකයා ඉන්නවා. මේ රටේ නායකයා නොදැනුවත්ව ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමට ගුවන් යානා 8ක් ගෙනෙන්න බැහැ. එහෙම නම්, හාල් මැස්සෙක් තමයි කපිල චන්ද්‍රසේන කියන්නේ. හාල් මැස්සා තමයි ඩොලර් මිලියන 2ක් -රුපියල් කෝටි 38ක්- තමන්ගේ නෝනාගේ ගිණුමට බැර කරවාගෙන තිබෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ඡන්දය දුන්නු ලක්ෂ 29ක් වන මේ රටේ බුද්ධිමත් මධ්‍යස්ථ මිනිසුන්ට අපි පැහැදිලිවම කියනවා, මේ ගොල්ලෝ මොන වාගේ හොරකමක්ද කරලා තිබෙන්නේ කියා කල්පනා කර බලන්න කියලා. මේ ගොල්ලෝ මොන වාගේ හොරකමක්ද කරලා තිබෙන්නේ? මේ රට, ජාතිය බේරා ගැනීම සඳහා මහා ජාතිකවාදින් විධියට බලයට ආපු අය අද ඒ හොර නඩයේ පිරිසක් බවට පත් වෙලා ඉන්නවා. මේ අය තමයි ඒ හොර නඩයේ පිරිස. එහෙම නැත්නම් දවස් 52 ආණ්ඩුවෙන් කපිල චන්ද්‍රසේන මහත්මයාට මේ promotion එක ලැබෙන්නේ නැහැ. මේක නාඩගමක්. මේ නාඩගමේ කොටසක් තමයි, ඊයේ පෙරේදා උදයංග වීරතුංග මහත්මයාගේ පැමිණීම. මේක නාට්‍යයක්. මෙහි පිටපතේ තිබෙන ආකාරයට උදයංග වීරතුංග එනවා, උසාවියට ඉදිරිපත් කරනවා. හඬ පට හා සම්බන්ධ රන්ජන් රාමනායක මහත්මයාට ඇප දුන්නේ නැහැ. හැබැයි ගරු මන්ත්‍රීවරුනි, උදයංග වීරතුංග මහත්මයාට ඇප දෙන්න පුළුවන් විධියටයි ඔහු උසාවියට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ අවස්ථාවේ හිටපු විනිසුරුතුමාට පින් සිද්ධ වෙන්න, එතුමා ඍජුව ඒ තීන්දුව නොගන්න මේ වෙනකොටත් උදයංග වීරතුංග එළියේ. ඒක තමයි ඇත්ත. පොලීසිය ඔහු උසාවියට ඉදිරිපත් කර තිබුණේ ඇප ලැබෙන විධියට.

අපි පැහැදිලිවම කියනවා, වාසුදේව නානායක්කාර ඇමතිතුමා වාගේ හොඳ මිනිස්සුත් ආණ්ඩු පක්ෂය පැත්තේත් ඉන්නවා කියලා. ඔබතුමන්ලා එළියට ඇවිල්ලා කථා කරන්න. ඔබතුමන්ලා හොරු නොවෙයි. ඔය පැත්තේ සිටින, හොරු නොවන අය එළියට ඇවිල්ලා කථා කරන්න. කපිල චන්ද්‍රසේන මහත්මයාත්, උදයංග වීරතුංග මහත්මයාත් බේරන්න අද කටයුතු කරමින් ඉන්නවා. රාජපක්ෂ පාලනය හොරුන් අත්අඩංගුවට ගන්න එක, ඔවුන්ට දඬුවම් කරන එක නොවෙයි කරන්න යන්නේ. හොරුන්ට නිදහස දෙන්නයි අද කටයුතු කරමින් ඉන්නේ. ඒක තමයි උදයංග වීරතුංග අත්අඩංගුවට අරගෙන මේ විධියට කටයුතු කරමින් ඉන්නේ. අපි පැහැදිලිවම කියනවා, කපිල චන්ද්‍රසේන මහත්මයා විතරක් නොවෙයි, එවකට හිටපු සභාපතිවරයා ඇතුළු සියලුදෙනා වහාම අත්අඩංගුවට ගත යුතුයි කියලා. මේක මහ දවල් අතේ පත්තු වුණු හොරකමක් බවට පත් වෙලා තිබෙනවා. ගිණුම්වලට ඩොලර් මිලියන 2ක් බැර වෙලා තිබෙනවා. එහෙම නම් තවත් බල-බලා ඉන්නේ මොකටද? මේ ගොල්ලන් ඒ සම්බන්ධයෙන් මොකවත් කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ ගොල්ලන්ට ඡන්ද දුන්නු ලක්ෂ 69ක් වූ ජනතාවගෙන් ලක්ෂ 29ක් හිතාගෙන සිටියා, මේ ගොල්ලන් දිනපු ගමන්ම සහරාන්ලාගේ බජාර් එකට දඬුවම් දෙයි කියලා, ශ්‍රී ලංකා මහ බැංකුවේ හොරකම කරපු අයට දඬුවම් දෙයි කියලා. නමුත් අද කාටද දඬුවම් දෙන්නේ? මේ සභාවේ ඉන්න රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාටයි දඬුවම් දෙන්නේ. මෙන්න දඬුවම් ලබන මිනිස්සු. ඒ ඇයි? හොරකම් කරලාද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
හොරු අල්ලන්න ගිය නිසා.